Answer

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය 2017

### 11 ශ්‍රේණිය

## ව්‍යවසායකත්ව අධ්‍යයනය පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | (ii) | (11) | (ii) | (21) | (iv) | (31) | (ii) |
| (2) | (i) | (12) | (iv) | (22) | (iv) | (32) | (iii) |
| (3) | (iii) | (13) | (iii) | (23) | (iii) | (33) | (i) |
| (4) | (iv) | (14) | (ii) | (24) | (iv) | (34) | (ii) |
| (5) | (i) | (15) | (iv) | (25) | (i) | (35) | (iii) |
| (6) | (ii) | (16) | (ii) | (26) | (ii) | (36) | (iii) |
| (7) | (iii) | (17) | (iv) | (27) | (i) | (37) | (ii) |
| (8) | (i) | (18) | (ii) | (28) | (ii) | (38) | (iii) |
| (9) | (i) | (19) | (iv) | (29) | (iv) | (39) | (ii) |
| (10) | (i) | (20) | (i) | (30) | (iv) | (40) | (iv) |

එක් නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගින් මුළු ලකුණු 40 කි.

### II පත්‍රය

(1) (i) (අ) ඇඳුම් පැළඳුම්
(ආ) පාවහන් (ලකුණු 1 බැගින් ලකුණු 2)

(ii)
- සුබවාදී බව හා අධිෂ්ඨානශීලී ගතිලක්ෂණ
- ව්‍යාපාර කටයුතු සඳහා යොදාගත් තම පෞද්ගලික ගොඩනැගිල්ල.
- තම බිරිඳගෙන් ලැබෙන සහයෝගය.
- ව්‍යාපාරික ප්‍රජාව ඇසුරු කිරීමෙන් ලත් අත්දැකීම්.
- තමා සතුව පවතින සැලසුම්සහගත බව.
- ගුණාත්වයෙන් යුතු නිෂ්පාදිත සාධාරණ මිලකට අලෙවි කිරීම.

(පිළිගත හැකි වෙනත් කරුණු)
(කරුණු 2 කට ලකුණු 2)

(iii) (අ) කාන්තාවන්
(ආ) සිනිඳු ඉන්ඩස්ට්‍රීස්
(ලකුණු 1 බැගින් ලකුණු 2)

(iv)
- උපයා ගන්නා ලාභ හෝ බැංකු ණය ගැනීමක් මගින් හෝ සපයා ගන්නා මූල්‍ය පහසුකම් ව්‍යාපාරික කටයුතු සඳහා විධිමත්ව ආයෝජනය කර ව්‍යාපාර කටයුතු පුළුල් කිරීම.
- පෞද්ගලික අලෙවිය විකුණුම් ප්‍රවර්ධන ක්‍රම යනාදිය භාවිතා කර අලෙවි කටයුතු ඉහළ දැමීමට කටයුතු කිරීම.

(පිළිගත හැකි කරුණු 2කට ලකුණු 2)

(v) වෙනත් තරගකාරී ආයතනවලින් නිෂ්පාදන මත බදු අය කිරීමට තීරණය කිරීම. බැංකු ණය සඳහා අය කරන පොලී අනුපාතය ඉහළ දැමීම. (බාහිර පරිසර සාධක තුළින් එල්ල වන තර්ජන සඳහා)
(කරුණු දෙකකට ලකුණු 2)

<u>සිනිඳු ඉන්ඩස්ට්‍රීස්</u>

(i) ද්‍රව්‍ය පිරිවැය - නිදසුන්: සම්, ගම්, නූල්
ශ්‍රම පිරිවැය - නිදසුන්: නිෂ්පාදන වැටුප්, කළමනාකරණ වේතන
වෙනත් පිරිවැය - නිදසුන්: විදුලිය, යන්ත්‍ර ක්ෂය වීම
(නිදසුන සමග එක් මූලිකාංගයකට ලකුණු 1 බැගින් ලකුණු 2)

(ii) 1400 x 2000 = රු. 2,800,000 (ලක්ෂ 28)
(රු) (ලකුණු 2)

(iii)

| | |
|---|---|
| ප්‍රචාරණ වියදම් | 160,000 |
| ඇසුරුම්, ප්‍රවාහන | 36,000 |
| වෙනත් | 28,000 |
| මුදල් ගලායෑම් | 224,000 |

(මෙම අගයට ලකුණු 2)

(iv) (අ) - නිෂ්පාදන පිරිවැය ඇස්තමේන්තුව (හෝ නිෂ්පාදන පිරිවැය සැලැස්ම
(ආ) - අලෙවි ඇස්තමේන්තුව (හෝ අලෙවි සැලැස්ම
(එකකට ලකුණු 1 බැගින් ලකුණු 2)

(v)
- විදුලිය, දුරකථන ගාස්තු, යනාදී නිෂ්පාදන බහුකාර්ය පිරිවැය පාලනය කරගැනීම්.
- ගුණාත්වයෙන් යුතු අමුද්‍රව්‍ය, අඩු මිලට /සාධාරණ මිලට වෙනත් සැපයුම්කරුවන්ගෙන් ලබා ගැනීම.

(පිළිගත හැකි කරුණු දෙකකට ලකුණු 2)

(2) (i) ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපෑම් ඇති කරනු ලබන එහෙත් ව්‍යාපාරය පාලනය කිරීම අපහසු සාධක ක්‍රියාත්මක වන පරිසරයයි.
හෝ

ව්‍යාපාරයේ පාලනයට නතු කළ නොහැකි ආර්ථික, දේශපාලනික, නෛතික, සමාජ සංස්කෘතික, ආදී පරිසර සාධක තුළින් ව්‍යාපාරයට බලපෑම් ඇති කරවන පරිසරය. (ලකුණු 2)

(ii)
- තම ව්‍යාපාරයේ පවතින ශක්තීන්
- තම ව්‍යාපාරයේ පවතින දුර්වලතා

(ලකුණු 2)

(iii)
- ව්‍යාපාරික අවස්ථා
- මුහුණ දීමට සිදුවන තර්ජන. (ලකුණු 2)

(iv)
- රූපලාවණ්‍ය, විලාසිතා, හැඩගැන්වීම් ක්ෂේත්‍ර සඳහා වැඩි ඉල්ලුමක් පැවතීම.
- සැකසූ ආහාර සඳහා ඉල්ලුම ඉහළ යාම.
- සෞඛ්‍ය ආරක්ෂිත ආහාර නිෂ්පාදන ඉහළ යාම.
- පරිසර හිතකාමී නිෂ්පාදන සඳහා නැඹුරුවක් ඇතිවීම.
- සන්නිවේදන, ප්‍රවාහන, මූල්‍ය සේවාවල ඇති වූ දියුණුව .
- සංචාරක කර්මාන්තයේ ව්‍යාප්තිය.

පිළිගත හැකි වෙනත් කරුණු.

(කරුණු 2කට ලකුණු 2)

(v)
- නව ආදායම් මාර්ග සකස් කරගත හැකිවීම.
- වෙළෙඳපොල තරගයට මුහුණදීමට හැකිවීම.
- නව ව්‍යාපාරික අවස්ථා ප්‍රයෝජනයට ගත හැකිවීම.
- මෙතෙක් ප්‍රයෝජනයට නොගත් සම්පත් ප්‍රයෝජනයට ගැනීමට අවස්ථාව සැලසීම.
- පාරිසරික ගැටලු අවම කරගත හැකිවීම.
- තම ඉලක්ක හා අරමුණු කරා යා හැකිවීම.

පිළිගත හැකි වෙනත් කරුණු

(කරුණු 2කට ලකුණු 2)

(3) (i) උපතින් - පවුල, සහජ හැකියාව

බාහිර උත්තේජක මගින් - අධ්‍යාපනය/සම්මන්ත්‍රණ,වැඩමුළු/රජයේ බදු සහන ලැබීම්/ආදර්ශවත් චරිත අනුකරණය/පළපුරුද්ද...

(එක් කරුණකට ලකුණු 1 බැගින් ලකුණු 2)

(ii)
- අරමුණක් පැවතීම.
- සීමාසහිත සම්පත් භාවිතා කිරීම/යොදවා තිබීම.
- ගනුදෙනුවල නිරත වීම.
- අවදානම් දැරීම.
- ආර්ථික කටයුත්තක නියැලීම.
- තරගයට මුහුණ දීම.
- පැවැත්ම ගැන සිතීම

(දෙකකට ලකුණු 2)

(iii)

| නිරීක්ෂණය | ව්‍යාපාරිකයා | ව්‍යවසායකයා |
|---|---|---|
| ව්‍යාපාරික කටයුතු මෙහෙයවීම | ගතානුගතික හා සාම්ප්‍රදායික ක්‍රමයට | පාරිසරික වෙනස්කම් සැලකිල්ලට ගනිමින් නිර්මාණශීලී, නවෝත්පාදන පදනම් කරගෙන. |
| ඉලක්ක ඇති කරගැනීම | ඉතා ආසන්න ඉලක්ක ඇතිකර ගනී. උදා: ඉක්මන් ලාභ ලැබීම. | දිගුකාලීන දැක්මක් සහිතව දූරදර්ශී ඉලක්ක ඇතිකර ගනී. උදා: වෙළඳපොල දිගු කාලයක් රැඳී සිටීම. |

(වෙනස පැහැදිලි වන සේ කරුණු දෙකකට ලකුණු 2)

(iv)
- අසාර්ථක වීම් ඉවසීමෙන් යුතුව දරා ගැනීම හා එම අසාර්ථකත්ව ක්‍රමයෙන් ඉවත් කරගෙන ඉදිරියට යාම.
- ගැටලු අභියෝග ලෙස දැකීම තුළින්
- නිර්මාණශීලී පුහුණු අවස්ථා අත්පත් කරගැනීම.
- නිර්මාණාත්මක හැසිරීම් ආදර්ශනය/අනුකරණය
- විවිධ ආකාරයට සිතීම/දැකීම/ ඒ අනුව කටයුතු කිරීම.
- කුතුහලය තුළින් නව නිර්මාණ කරා යොමුවීම. (කරුණු දෙකකට ලකුණු 2)

(v)
- ව්‍යාපාර අදහස පැහැදිලි කිරීමට.
- ව්‍යාපාරයේ අනාගත දිශාව පෙන්නුම් කිරීමට.
- ව්‍යාපාරයේ ඉලක්ක හෝ අරමුණු ඉටුකර ගැනීමට.
- අරමුදල් සම්පාදනය කරගැනීමට
- ව්‍යාපාර පරිසරය පිළිබඳව අවබෝධයක් ලැබීමට.
- ව්‍යාපාරය පිළිබඳ සමස්ත අවබෝධය ලැබීමට.

පිළිගත හැකි වෙනත් කරුණු

(කරුණු දෙකකට ලකුණු 2)

(4) (i)
- යොදවා ඇති ප්‍රාග්ධනය බොහෝ විට කුඩා ප්‍රමාණයේ එකක් වීම.
- සුළු සේවක සංඛ්‍යාවක් සිටීම.
- පවුලේ සාමාජිකයින්ගේ දායකත්වය ලැබීම.
- පිරිවැටුම/ධාරිතාව සුළු මට්ටමකින් පැවතීම.
- ග්‍රාමීය/ප්‍රාදේශීය ලෙස ව්‍යාප්තව තිබීම.
- සරල මට්ටමේ සංවිධාන ව්‍යුහයක් පැවතීම.

- ශ්‍රම සූක්ෂම වීම.
- නව තාක්ෂණ භාවිතය අවම මට්ටමක පැවතීම.
- රජය බදු සඳහා දායකවීම් අඩු මට්ටමක පැවතීම.

පිළිගත හැකි වෙනත් කරුණු

(කරුණු දෙකකට ලකුණු 1 බැගින් කරුණු 4කට ලකුණු 2)

(ii)
- රූපලාවන්‍ය මධ්‍යස්ථාන
- සන්නිවේදන මධ්‍යස්ථාන
- දිවා සුරැකුම් මධ්‍යස්ථාන
- ක්ෂණික ආහාර (කෙටි ආහාර) සැපයීම්.
- රට කජු විකිණීම/බුලත් විට විකිණීම.
- එළවළු මැස්සක්/පලතුරු මැස්සක්

පිළිගත හැකි වෙනත් කරුණු

(කරුණු දෙකකට ලකුණු 1 බැගින් කරුණු 4කට ලකුණු 2)

(iii)
- අවශ්‍ය භාණ්ඩ අවශ්‍ය ප්‍රමාණයෙන් ලබාගත හැකිවීම.
- සමීප සම්බන්ධතාවයක් පවත්වාගත හැකිවීම.
- බොහෝ විට ණයට භාණ්ඩ ලබාගත හැකිවීම.
- භාණ්ඩ තෝරාගැනීමට හැකිවීම.
- විශාල පරිමාණ ව්‍යාපාරවලින් ලබාගත නොහැකි භාණ්ඩ ලබාගත හැකිවීම.
- අලුත් නිෂ්පාදන ලබාගත හැකිවීම. උදා: එළවළු/පලතුරු

(කරුණු දෙකකට ලකුණු 2)

(iv)
- මූල්‍ය දුෂ්කරතා
- කළමනාකාරිත්ව හැකියාව අවම වීම.
- තෝරාගත් ව්‍යාපාරික ස්ථානයේ නොගැළපීම්
- සැලසුම් සහගත බවක් නොතිබීම.
- සැලසුම්කරණයක් නොතිබීම.
- පවුලේ සාමජිකයින්ගේ බලපෑම්.
- සේවකයින්ගේ අකාර්යක්ෂමතාවය.
- ව්‍යාපාරයේ මුදල්, භාණ්ඩ පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම බහුලව සිදුවීම.

(කරුණු දෙකකට ලකුණු 1 බැගින් කරුණු 4කට ලකුණු 2)

(v)
- සැලසුම්කරණයකින් යුතුව කටයුතු කිරීම.
- ව්‍යාපාරික ස්ථානය, පාරිභෝගිකයින් ආකර්ෂණයට හේතුවන අයුරින් පවත්වා ගැනීම.
- පවුලේ අයගේ විවිධ බලපෑම්වලින් ඈත්වීම.
- ලාභ, ව්‍යාපාරික කටයුතු සඳහා ආයෝජනය කිරීම.
- හොඳ කළමනාකාරිත්වයකට යොමු වීම.

පිළිගත හැකි වෙනත් කරුණු

(කරුණු දෙකකට ලකුණු 1 බැගින් කරුණු 4කට ලකුණු 2)

(5) (i)

| පාරිභෝගිකයාට | ආර්ථිකයට |
|---|---|
| • නවනිෂ්පාදන පරිභෝජනයට අවස්ථාව ලැබීම.<br>• අඩු මිලට භාණ්ඩ ලබාගත හැකිවීම.<br>• ජීවන තත්ත්වය ඉහළ යාම. | • රැකියා උත්පාදනය.<br>• සම්පත් උපයෝජනය ඉහළ යාම.<br>• නිෂ්පාදනය වැඩි වීම.<br>• නව නිෂ්පාදන බිහිවීම හා ආර්ථික දියුණුව වේගවත් වීම. |

(පාරිභෝගිකයාට හා ආර්ථිකයට කරුණු දෙකකට ලකුණු 1 බැගින් ලකුණු 2)

(ii) කළමනාකරණ භූමිකාව - A, D, E

නායකත්ව භූමිකාව - B, C, F

(සියලු කරුණු නිසි ආකාරයට වර්ග කිරීම කර ඇත්නම් ලකුණු 2 හිමි වේ. නැත්නම් ලකුණු 0 වේ.)

(iii)
- නිවාස අහිමි අඩු ආදායම් ලාභීන්ට නිවාස ඉදිකරදීම.
- පාසල් සෞඛ්‍ය මධ්‍යස්ථාන අලුත්වැඩියා කිරීම.
- පාසල් හැරගිය අය සඳහා වෘත්තීය පුහුණු අවස්ථා ලබාදීම.
- වෛද්‍ය සායන පැවැත්වීම.

පිළිගත හැකි වෙනත් කරුණු

(කරුණු දෙකකට ලකුණු 1 බැගින් ලකුණු 2)

(iv)
- සංකල්පනාත්මක කුසලතා.
- මානව කුසලතා.
- තාක්ෂණික කුසලතා.
- සන්නිවේදන කුසලතා.
- උපදේශනාත්මක කුසලතා.
- කණ්ඩායමක් සමග කටයුතු කිරීමේ කුසලතා.
- ආදර්ශමත්ව කටයුතු කිරීමේ කුසලතා.

(කරුණු දෙකකට ලකුණු 2)

(v)
- කුමන භාණ්ඩ හෝ සේවාව ඉදිරිපත් කිරීමට ද? යන්න. (පදනම් වන නිෂ්පාදනය)
- නව නිෂ්පාදිතය සපයා ගන්නේ කවර අන්දමින්ද? (තමාම නිපදවන්නේද/පිටතින් මිල දී ගන්නේද)
- ඒ සඳහා කොපමණ ප්‍රාග්ධනයක් අවශ්‍ය වේද?
- ප්‍රාග්ධනය සපයා ගන්නේ කවර ලෙසට ද?
- ඉලක්කගත පාරිභෝගික කොටස කවුරුන්ද?
- ව්‍යාපාරික ස්ථානය කොතනද?
- තනිවද? හවුල් වශයෙන් ව්‍යාපාරය ආරම්භ කරන්නේද?
- ඉපයීම් ප්‍රමාණවත්ද?

(කරුණු හතරකට ලකුණු 2)

**Answer**

(6) (i) (අ)

| | (රු.) |
|---|---|
| වඩු කාර්මික වැටුප් | 40,000 |
| දැව සඳහා | 80,000 |
| වෙනත් ද්‍රව්‍ය සඳහා | 22,000 |
| ගොඩනැගිලි කුලිය | 15,000 |
| උපකරණ ක්ෂය වීම් | 3,000 |
| මුළු නිෂ්පාදන පිරිවැය | 160,000 (ලකුණු 2) |

(ආ) $\frac{\text{මුළු නිෂ්පාදන පිරිවැය}}{\text{අල්මාරි 10}} = \frac{160000}{10}$

= රු. 16000 (ලකුණු 2)

(ඇ)

| | |
|---|---|
| අල්මාරියක පිරිවැය | 16000 |
| එකතු කළා:- 50% ලාභය | 8000 |
| $16000 \times \frac{50}{100}$ | |
| අල්මාරියක විකුණුම් මිල | 24000 (ලකුණු 2) |

(ii)

ඇස්තමේන්තුගත ආදායම් ප්‍රකාශය (රු.)

| | | |
|---|---|---|
| විකුණුම් ආදායම (24000 x 10) | 240000 | 2 |
| අඩු කළා: නිෂ්පාදන පිරිවැය | (160000) | 1 |
| ශුද්ධ ලාභය | 80000 | 1 |

(ලකුණු 4)

(7) (i)
(අ) විධායක සාරාංශය — ලකුණු 01
(ආ) අලෙවි සැලැස්ම / අලෙවි ඇස්තමේන්තුව — ලකුණු 01
(ඇ) නිෂ්පාදන පිරිවැය ඇස්තමේන්තුව — ලකුණු 01
(ඉ) ආයෝජන ඇස්තමේන්තුව — ලකුණු 01

(ii)

නැචුරල් ෆුඩ්ස්
2017 - 09 - 30 න් අවසන් වූ මාසය සඳහා
ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | රු. | රු. | |
|---|---|---|---|
| **අපේක්ෂිත මුදල් ලැබීම්** | | | |
| ප්‍රාග්ධනය | 150,000 — $\frac{1}{2}$ | | (02) |
| බැංකු ණය | 50,000 — $\frac{1}{2}$ | | |
| අලෙවි ආදායම | 75,000 (01) | 275,000 | |
| | | 275,000 | |
| **අපේක්ෂිත මුදල් ගෙවීම්** | | | |
| පලතුරු මිලදී ගැනීම් | 35,000 | | |
| උපකරණ සඳහා | 15,000 | | |
| සේවක වැටුප් | 8,000 | | (03) |
| ව්‍යාපාරික නාමය ලියාපදිංචිය | 6,000 | | |
| ගොඩනැගිලි කුලිය | 5,000 | | |
| ප්‍රචාරණ වියදම් | 7,000 | 760,000 | |
| | | 76,000 | |
| 2017-09-30 මුදල් ශේෂය | | 199,000 | (01) |